www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද සසප ජනාධිපති අපේක්ෂක බිල් වෑන් ඕකන් ශ්‍රී ලංකාවේ දී රැස්වීම් දෙකක් අමතයි

## US SEP presidential candidate Bill Van Auken addresses two meetings in Sri Lanka

**වාර්තාකරුවකු විසිනි**
**2004 ඔක්තෝබර් 28**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) එක්සත් ජනපදයේ සිය සහෝදර සසපයේ ජනාධිපති අපේක්ෂක බිල් වෑන් ඕකන් විසින් අමතන ලද, ඉරාක යුද්ධය සහ එක්සත් ජනපද මැතිවරනය යන මැයෙන් යුත් සාර්ථක රැස්වීම් දෙකක් පසුගිය සතියේ දී කොලඹ දී හා මහනුවර දී පැවැත්වීමට සමත් විය.

පසුගිය සෙනසුරාදා කොලඹ නගර මධ්‍යයේ නව නගර ශාලාවේ දී පැවති රැස්වීමට දිවයින පුරා ම විවිධ ප්‍රදේශවලින් පැමිනි සියලු තරාතිරම්වලට අයත් 250කට අධික පිරිසක් සහභාගි විය. හැටන් හා බන්ඩාරවෙල තේ වතු ප්‍රදේශවල සිට පැය ගනනාවක් ගත කොට බස් රථවලින් පැමිනි වතු කම්කරුවෝ අගනුවර කම්කරුවන්, විද්වතුන්, ශිෂ්‍යයන් සහ කාර්යාල සේවකයන් සමග රැස්වීමේ ශාලාවේ සිටියහ. දිවයිනේ දකුනු පලාතේ අම්බලන්ගොඩ සහ මාතර ප්‍රදේශවලින් පැමිනි ගැමියන් හා කම්කරුවෝ ද කොලඹට ලඟා වනු පිනිස හමුදාවේ හා එල්ටීටීඊයේ මාර්ග බාධක මැදින් පැය 12ක් තිස්සේ බස්වලින් හා දුම්රියෙන් ගමන් කිරීමට සිදු වූ යාපනයෙන් පැමිනි ධීවරයන් 10 දෙනෙකුගෙන් යුත් කන්ඩායමක් ද රැස්වීමට සහභාගි වූහ.

රැස්වීමේ සිටි වැඩි දෙනෙක් සසප සාමාජිකයන් හා ආධාරකරුවන් වූ නමුත් සසප උද්ඝෝෂනයේ ප්‍රතිඵලයක් ලෙස තවත් සැලකිය යුතු සංඛ්‍යාවක් ද පැමින සිටියේ ය. සමහරෙක් පෝස්ටර් හෝ පත්‍රිකා කියවා තිබූ අතර තවත් අය *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හරහා හෝ වෑන් ඕකන්ගේ සංචාරය පිලිබඳ මාධ්‍ය ආවරනය මගින් හෝ රැස්වීම ගැන දැන ගති. ඉරාකයේ එක්සත් ජනපද වාඩිලෑමට එරෙහිව ශ්‍රී ලංකාව තුල වෙනත් කිසිදු පක්ෂයක් රැස්වීම් නො තබන නමුත් එයට පුලුල්ව පැතුරුනු විරුද්ධත්වයක් පවතී.

වෑන් ඕකන්ගේ කතාවට සවන් දීමට රූපවාහිනී හා පුවත්පත් මාධ්‍යවේදියෝ ද පැමින සිටියහ. ජනප්‍රිය රූපවාහිනී සේවයක් වන *සිරස ටීවී* මාධ්‍ය ජාලය රැස්වීමේ සැලකිය යුතු කොටසක් රූගත කල අතර ඉරිදා සිය ජාතික ප්‍රවෘත්ති ප්‍රකාශයන්හි දී එයින් කෙටි වාර්තාවක් විකාශනය කලේ ය. එම මාධ්‍ය ජාලයේ ඉංග්‍රීසි හා දෙමල භාෂා නාලිකා ද — *එම්ටීවී* සහ *ශක්ති ටීවී* — එම වාර්තාව ප්‍රචාරය කලේ ය.

දෙවන රැස්වීම පැවැත්වූයේ කොලඹ සිට කිලෝ මීටර් 115ක් දුරින් පිහිටි මහනුවර අසල පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ දී සඳුදා ය. දර්ශන විද්‍යා සංගමයේ අනුග්‍රහය යටතේ පැවති රැස්වීම ශිෂ්‍යයන් හා අධ්‍යයන කාර්ය මන්ඩලය අතර දැවැන්ත උනන්දුවක් දල්වාලීමට සමත් විය. 100කට අධික පිරිසක් එයට සහභාගි වූ අතර එයින් බහුතරය විශ්වවිද්‍යාලයෙන් මෙන් ම ප්‍රදේශයේ පාසල්වලින් පැමිනි සිසුන් ය. බොහෝ දෙනෙකුට රැස්වීමට පෙරාතුව සසප සමග සබඳතා නො තිබුනු තරම් වන අතර ඔවුහු විභාගවල පීඩනය නොතකා පැමින සිටියහ. රැස්වීමට සහභාගි වූ එක් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයකුට අනුව, එය වනාහි මෑතක එහි පැවති විශාලතම දේශපාලන රැස්වීම විය.

රැස්වීම පැවැත්වුනේ ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ශිෂ්‍ය අංශය වන අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) සසප උද්ඝෝෂනය වලකාලීමට දැරූ ප්‍රයත්නයන් නො තකා ය. සිංහල ස්වෝත්තමවාදය හා ජනතාවාදී වාචාලත්වය මත පදනම් වූ පක්ෂයක් වන ජවිපෙ සිසුන් ඉදිරියේ "සමාජවාදී" සහ "මාක්ස්වාදී" වේශයෙන් පෙනී සිටීමට උත්සාහ දරයි. දැන් ප්‍රථම වතාවට ආන්ඩුවට එක්වී සිටින ජවිපෙ එක්සත් ජනපදය සිදු කල නීති විරෝධී ඉරාක ආක්‍රමනයට එරෙහිව කිසිදු ආස්ථානයක් ගෙන නැත. රැස්වීම පැවති දින අවිශිබම සාමාජිකයෝ සසප උද්ඝෝෂකයන් වෙත පැමින ඔවුන්ගේ උද්ඝෝෂනය නතර කල යුතු යයි අවධාරනය කලහ. තමන්ගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා සඳහා කිසිදු හේතුවක් ඉදිරිපත් කිරිමට අසමත් වූ ඔවුහු විශ්වවිද්‍යාලය තුලට දේශපාලනය ගේන්න එපා" යයි සසප සාමාජිකයන්ට තිකම්ම අන කල අතර තමන් බලය පාවිච්චි කරන බවට ද අනතුරු ඇඟවූහ.

සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් කොලඹ රැස්වීමේ මුලසුන ඇරීය. ඔහු බිල් වෑන් ඕකන් මෙන් ම ඕස්ට්‍රේලියාවේ හා කැනඩාවේ සසප සහෝදර

පක්ෂවලින් පැමින සිටි නියෝජිතයන් ද රැස්වීම් ශාලාවේ සිටි ඉන්දියාවෙන් පැමිනි ආධාරකරුවන් ද පිලිගත්තේ ය.

"ශ්‍රී ලංකාවේ කම්කරුවන් හා පීඩිතයන් ඇමතීමට එක්සත් ජනපද සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා පැමිනීම අපගේ ලෝක ව්‍යාපාරයත් *ලෝක සමාජවාදී වෙබ් අඩවියත්* ගෙන යන උද්ඝෝෂනයේ ජාත්‍යන්තර ස්වභාවය මූර්තිමත් කරනවා" යයි ඔහු පැවසී ය. "එක්සත් ජනපදයේ ජනාධිපති තෝරා පත් කර ගැනීම ලෝක සිද්ධියක් ලෙසයි අප සලකන්නේ. ඒ මක් නිසා ද කිය තොත් ඇමරිකාවේ ප්‍රධාන විධායකයා ගන්නා තීන්දු සහ ක්‍රියාමාර්ග අන් කවර දාකටත් වඩා ලොව පුරා මහජනතාවගේ ජීවිතවලට හා ඉරනමට බලපාන නිසයි."

ඉරාකයේ හා ඇෆ්ඝනිස්තානයේ එක්සත් ජනපද නායකත්වයෙන් ගෙන ගිය ආක්‍රමනවලට පසුව උප-මහාද්වීපය පුරා පාලක ප්‍රභූන් වොෂිංටනයට සිය බියගුලු යටත් වීම පෙන්නුම් කර ඇති බව ඩයස් පෙන්වා දුන්නේ ය. නිදසුනක් ලෙස, වත්මන් පාලක සභාගයේ කොටසක් වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශීතල යුද්ධ සමයේ දී මොස්කෝවේ හා බෙයිජිනයේ සහයෝගය සහිතව අධිරාජ්‍ය විරෝධී පූච්චානම් හඬ තැලීමට පුරුදුව සිටියේ ය. කෙසේ වෙතත් සෝවියට් සංගමය බිඳ වැටීමත් සමග ම, ශ්‍රීලනිපය ස්වාධීනත්වය පිලිබඳ මවාපෑම් මුලුමනින් ම අතහැර දමා තිබේ.

ඉරාකයේ හා ඇෆ්ඝනිස්තානයේ ගෙන ගිය නීති විරෝධී එක්සත් ජනපද ආක්‍රමනයට එරෙහිව ද දිවයිනේ හා කලාපය පුරා කම්කරුවන් සඳහා ජාත්‍යන්තරවාදී හා සමාජවාදී ක්‍රියාමාර්ගයක් වෙනුවෙන් ද ස්ථිරසාරව සටන් වැදුනු ශ්‍රී ලංකාවේ එකම පක්ෂය සසප බව ඩයස් පැහැදිලි කලේ ය.

වැන් ඕකන් සිය දේශනය ආරම්භ කලේ ඇමරිකාවේ ඡන්ද විමසීමට යන්තම් සති කිහිපයක් තිබිය දී යුරෝපයේ හා දකුනු ආසියාවේ රැස්වීම් අමතනු පිනිස සිය ජනාධිපති අපේක්ෂකයා එවීමට සසප තීන්දු කලේ මන් ද යනුවෙන් විමසන අයට පිලිතුරු දෙමිනි.

"කොලඹ එක් මාධ්‍ය පන්ඩිතයෙක් යෝජනා කොට තිබුනේ ඒ මට මෙහි දී වැඩි මාධ්‍ය ප්‍රචාරයක් ලබා ගත හැකි නිසා ය කියා යි. මෙය පැහැදිලිව ම මතු කරන ප්‍රශ්නය නම් ප්‍රථම කොට ම ඇමරිකානු ජනාධිපති අපේක්ෂකයෙක් ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආවරනයක් බලාපොරොත්තු වන්නේ ඇයි ද යන්න ය. එමගින් මට වැඩි පුර ඡන්ද ටිකක් දිනා ගත හැකි යයි මම නො සිතමි.

"නැත, එම තීන්දුව ගලා එන්නේ මගේ පක්ෂයේ ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනය වෙතිනි. 2004 මැතිවරනයේ අපගේ උද්ඝෝෂනයේ වඩාත් ම වැදගත් කර්තව්‍යය නම් කම්කරු පන්තියේ ජාත්‍යන්තර ඒකාබද්ධතාව සඳහා සටන් වැදීම සහ මෙම උද්ඝෝෂනය තුල දී සෑම රටක ම කම්කරුවන්ගේ අවශ්‍යතා නියෝජනය කිරීම ය."

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ගන්නා ක්‍රියාමාර්ග ලොව පුරා බිලියන සංඛ්‍යාත මහජනයා වෙත ජීවිතය හා මරනය සම්බන්ධ ප්‍රතිවිපාක ගෙන එන බව වැන් ඕකන් පැහැදිලි කලේ ය. එක්සත් ජනපදය, ලොව පුරා රටවලට සෘජුව තර්ජනය කරමින්, තමන් කැමති ඕනෑම ස්ථානයක, "පූර්ව-භංග" යුද්ධ, එනම් කිසිදු ප්‍රකෝපකරනයකින් තොර යුද්ධ, ගෙන යාමට තමන්ට අයිතියක් ඇතැයි ප්‍රකාශ කර තිබේ. එපමනක් නොව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව වැනි ඒජන්සි හරහා ශ්‍රී ලංකාව වැනි රටවල ආන්ඩුවලට පටි තද කර ගැනීමේ පිලිවෙත් නියම කිරීමෙහි ද වොෂිංටනය යෙදී සිටී.

ඩිමොක්‍රැටික් පක්ෂයේ ජනාධිපති අපේක්ෂක ජෝන් කෙරී කිසිදු විකල්පයක් ඉදිරිපත් කිරීමට අසමත්ව ඉරාක යුද්ධය ඇතුලු සියලුම අති මූලික ප්‍රශ්න සම්බන්ධයෙන් ජනාධිපති බුෂ්ගේ පිලිවෙත් සමග එකඟ වෙමින් ඒවා වඩා කාර්යක්ෂමව ක්‍රියාවට දැමීමට පවා ඉදිරිපත් වී ඇත්තේ මන් ද යන වග, වැන් ඕකන් සිය දේශනය තුල දී පැහැදිලි කලේ ය. ඇමරිකාවේ ධනවතුන් හා දුප්පතුන් අතර ගැඹුරු සමාජ පරතරය ද තෙවන පක්ෂවලට මැතිවරනයට ඉදිරිපත් වීමට ඇති අයිතිය ඇතුලු මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව වැඩෙන ප්‍රහාර ද ඔහු විස්තර කලේ ය.

මොන යම් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඇමරිකානු කම්කරු පන්තියට හෝ ලෝකයේ සෙසු ප්‍රදේශවල කම්කරුවන්ට කිසිදු ජාතික විසඳුමක් නොමැති බව සසප අපේක්ෂකයා පැහැදිලි කලේ ය. කම්කරුවන් ඒකාබද්ධ වීමේ අවශ්‍යතාව වෙනුවෙන් තර්ක කරමින් ඔහු පෙන්වා දුන්නේ දේශපාලන සංස්ථාපිතයේ පිලිවෙත් ඇමරිකාවේ ඓතිහාසික සම්ප්‍රදායන්ට සෘජුව ම ප්‍රතිවිරෝධී වන බවයි. ඇමරිකානු කම්කරුවන්ගේ උරුමය වන, ප්‍රථම ඇමරිකානු විප්ලවයේ පටන් සිවිල් යුද්ධය ද විසි වන සියවසේ කම්කරු පන්තික අරගල ද දක්වා වූ අරගලවල දිගු ඉතිහාසය ඔහු ගෙනහැර දැක්වී ය.

සිය දේශනය සමාප්ත කරමින් වැන් ඕකන් පෙර ඇඟවුම් කොට සිටියේ ධනවාදයේ ආර්ථික, දේශපාලනික හා සමාජ ප්‍රතිවිරෝධතා විප්ලවවාදී අරගලවල නව කාල පරිච්ඡේදයක පැන නැග්මට තුඩු දෙන බවයි. "අපගේ අවධානය යොමු වී තිබෙන්නේ නොවැම්බර් 2 දා ඡන්ද පෙට්ටි වෙත නොව, මෙම මැතිවරනයෙන් අනතුරුව එලඹෙන තත්වය පිලිබඳව ය. එය ධවල මන්දිරයට අරක් ගන්නා ඕනෑම පාලනාධිකාරයකට තියුනු අර්බුදවලට මුහුන දීමට සිදු වන කාල පරිච්ඡේදයක් වනු ඇත.

"අප සටන් වදින්නේ අව්‍යාජ ස්වාධීන කම්කරු ව්‍යාපාරයක් ගොඩනැගීම වෙනුවෙනි. එවන් ව්‍යාපාරයක් පැන නැගිය හැක්කේ සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයක පදනම මත ම පමනි. අපට එය කල හැක්කේ සෑම රටක ම කම්කරුවන්ගේ අරගල දැනුවත්ව ඒකාබද්ධ කරන ලෝක පක්ෂයක කොටසක් ලෙස පමනි."

රැස්වීම් ශාලාවේ සිටි සෑම අයෙකුට ම තේරුම් ගත හැකි වන පරිදි සමස්ත කතාව ම එම අවස්ථාවේ ම සිංහලට හා දෙමලට පරිවර්තනය කරන ලදි. එය ම ශ්‍රී ලංකාවේ සෙසු දේශපාලන රැස්වීම් හා උත්සව සියල්ලෙන් ම පාහේ සසප රැස්වීමෙහි වෙනස සලකුනු කලේ ය. එවන් සෙසු රැස්වීම්වල හා උත්සවවල ආධිපත්‍යය දරන්නේ ජාතිවාදය යි. කතාව සහ පරිවර්තන සඳහා පැය තුනක පමන කාලයක් ගත වූ නමුත් සභාව තුලින් නොඉවසිලිවන්ත ස්වභාවයක් මතු වූයේ නැති තරම් ය. ඔවුහු අනතුරුව පැවති ප්‍රශ්න හා පිලිතුරු සහිත සාකච්ඡාවට ද උනන්දුවෙන් සහභාගි වූහ. මහනුවර දේශනයෙන් අනතුරුව ද ජීවමාන සාකච්ඡාවක් පැවතුනි.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ පටන් පලස්තීනයේ ඊශ්‍රායල ප්‍රහාර ගැන සසප ආකල්පය හා එක්සත් ජනපදය තුල යුද විරෝධී ව්‍යාපාරයේ ස්වභාවය දක්වා වූ කාරනා ගනනාවක් සම්බන්ධයෙන් ප්‍රශ්න මතු කරන ලදි. විජේ ඩයස් ශ්‍රී ලංකාවේ යුද්ධයට කම්කරු පන්තික විසඳුමක් පිලිබඳ පක්ෂයේ ඉදිරිදර්ශනය පැහැදිලි කල අතර ගොවි ජනතාව සම්බන්ධයෙන් පක්ෂයේ ආකල්පය පිලිබඳ ගැටලුවකට ද පිලිතුරු දුන්නේ ය.

කොලඹ රැස්වීමේ දී ප්‍රශ්නයක් නැගූ එක් අයෙක්, රැස්වීම සඳහා ගෙන ගිය උද්ඝෝෂනයේ දී සිංහල භාෂාවෙන් පල කල පොත් පිංචක් ලෙස සිය ගනනින් අලෙවි කල එක්සත් ජනපද සසපයේ මැතිවරන ප්‍රකාශයෙන් කොටසක් කියවී ය. ඔහු උපුටා දැක්වූයේ සසප ක්‍රියාමාර්ගය සම්බන්ධ කොටසකි. එහි මෙසේ සඳහන් වේ: "දේපොල පිලිබඳ අයිතිවාසිකම් සමාජ අයිතිවාසිකම්වලට ද්විතීයික කල යුතු ය. මින් අදහස් වන්නේ සියලු දෑ ජනසතු කල යුතු බවක් හෝ යෝධ සංස්ථා හා බැංකු මගින් අඛන්ඩව පීඩාවට පත් කෙරෙන කුඩා හෝ මධ්‍යම පරිමාන ව්‍යාපාර අහෝසි කල යුතු බවක් හෝ නො වේ." ඔහු ඊලඟට විමසා සිටියේ සසප ජනසතුකරනය මත කුමන සීමාවන් පනවන්නේ ද යන වග යි.

සසප ප්‍රකාශය කතා කරන්නේ මහා සංගත හා බැංකු වැනි ආර්ථිකය මත ආධිපත්‍යය දරන මුදුන් ආයතන ජනසතු කිරීම ගැන යයි වැන් ඕකන් පැහැදිලි කලේ ය. "සියලු කුඩා ව්‍යාපාර ජනසතු කරන ලෙස ඉල්ලා සිටීම අනවශ්‍ය මෙන් ම නුසුදුසු" ක්‍රියාවකි. සෑම වසරක් පාසා ම සිදු වන බංකොලොත් වීම් පිලිබඳ විශාල සංඛ්‍යාවන් උපුටා දක්වමින් ඔහු පෙන්වා දුන්නේ සුලු ව්‍යාපාර ප්‍රධාන සංගත සමග ගැටෙන බවයි. ශ්‍රී ලංකාව තුල ද සුලු ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් පවතින බව ඔහු සඳහන් කලේ ය. කම්කරු පන්තිය ජනගහනයේ මෙම සැලකිය යුතු ස්ථරය විරසක කර ගත යුතු නැති බවත් සමාජවාදය සඳහා සිය අරගලයේ දී ඔවුන් තමන්ගේ පාර්ශ්වයට දිනා ගත යුතු බවත් ඔහු පැවසී ය.

කතිකයා සිය දේශනයේ දී උපුටා දැක්වූ ඇමරිකානු ජනාධිපති ඒබ්‍රහම් ලින්කන්ගේ ප්‍රකාශයක් යලි අවධානයට ලක් කලේ ය. වහල් ක්‍රමයට හිතැති ඩිමොක්‍රැටික් පක්ෂයට පහර දෙමින් ලින්කන් ප්‍රකාශ කොට තිබුනේ "තවත් මිනිසකුගේ දේපොල අයිතිය සමග ගැටෙන කල යම් මිනිසකුගේ නිදහස මුලුමනින් ම අහෝසි වන්නේ ය" යන අදහස එම පක්ෂය දරා සිටින බවයි. අප එය උඩු යටිකුරු කරන බව සඳහන් කරමින්, පුද්ගලික දේපොලවලට ඉඩ දෙනු ඇත්තේ එය නිදහස සමග ගැටුමකට නොඑලඹෙන තාක් දුරට යයි වැන් ඕකන් කියා සිටියේ ය.

"කම්කරු ආන්ඩුවක් ප්‍රජාතාන්ත්‍රිකව තීන්දු කරන අයුරින් වැටුප් ගෙවීමට, පාරිතෝෂික ලබා දීමට, සේවා කොන්දේසි පවත්වා ගෙන යාමට යම් ව්‍යාපාරයක් අසමත් වන්නේ නම් එම ව්‍යාපාරයේ පැවැත්ම සඳහා කිසිදු පදනමක් නොමැති වනු ඇත." ඕනෑම සමාජවාදී සමාජයකට අවශ්‍ය වනු ඇති මූලික ප්‍රමිතිය මෙය යයි පැවසූ ඔහු තව දුරටත් සඳහන් කලේ සුලු ව්‍යාපාරවලට ආධාර ලබා දෙන බවයි.

වැන් ඕකන්, එක්සත් ජනපදයේ යුද විරෝධී ව්‍යාපාරය පිලිබඳ ප්‍රශ්නයට පිලිතුරු දෙමින්, ඉරාක ආක්‍රමනයට පෙරාතුව එක්සත් ජනපදය තුලත් ලොව පුරාත් පැවති විරෝධතාවල පරිමාව විස්තර කලේ ය. "එක්සත් ජනපදය සිය ඉතිහාසය තුල පැවති විශාලතම විරෝධතා ව්‍යාපාර අත් දුටු" බව ඔහු පැවසී ය. "එහෙත් අප දන්නා පරිදි ඒවා බුෂ් මත කිසිදු බලපෑමක් කිරීමට අසමත් විය." පුලුල්ව පැතිර පවත්නා යුද විරෝධී මනෝගතීන්ට මොන යම් හෝ මාවතක් සැපයීම වලකාලනු පිනිස සිය පක්ෂයේ අපේක්ෂකයා ලෙස කෙරී පත් වීම සහතික කරගනු වස් ඩිමොක්‍රැටික් ප්‍රාථමික ඡන්ද ව්‍යාපාරය ඉහලින් අත දමා මෙහෙයවුනු ආකාරය ඔහු විස්තර කලේ ය. සසප, බුෂ්ට විකල්පයක් ලෙස කෙරී උලුප්පා දක්වන සියල්ලන්ට ම එරෙහිව වී ඇති අතර යුද විරෝධී ව්‍යාපාරය ද්වි-පක්ෂ ක්‍රමයෙන් බිඳී වෙන් විය යුතු බව අවධාරනය කොට තිබේ.

රැස්වීම් දෙකේ ම සාමාන්‍ය කටයුතු අවසන් වීමෙන් අනතුරුව බොහෝ දෙනෙක් වැන් ඕකන් හෝ සසප සාමාජිකයන් සමග කතා කරනු පිනිස රැඳී සිටි අතර ඔවුන් සමග ජීවමාන සාකච්ඡාවක් පැවතුනි. බොහෝ දෙනෙක් පිටව ගියේ සසප සමග තව දුරටත් සාකච්ඡා කරනු පිනිස සිය තොරතුරු ලබා දීමෙන් පසුව ය. කොලඹ රැස්වීමේ දී රුපියල් 4,400ක් මුදලක් — සාමාන්‍ය කම්කරුවකුගේ මාසික වැටුපට සමාන මුදලක් — එකතු වූ අතර රැස්වීම් දෙකේ දී ම රුපියල් 5,500ක සාහිත්‍ය අලෙවි විය. *ලෝක සමාජවාදී වෙබ් අඩවි විමර්ශන* යන නමින් සිංහල හා දෙමල භාෂාවෙන් වසරකට සිවු වරක් නිකුත් කෙරෙන සඟරාවට මෙන් ම ට්‍රොට්ස්කිවාදයේ ඉතිහාසය පිලිබඳ පොත්වලට ද ඉල්ලුමක් තිබිනි.

කොලඹ රැස්වීමේ දී බිල් වැන් ඕකන් කල කතාවේ පූර්න වාර්තාවක් නොබෝ දිනකින් පල කෙරෙනු ඇත.

© www.wsws.org